අදිසි

ජගත් ජේ එදිරිසිංහ ලියයි

3

ගේට්ටුවේ මුරට සිටි පොලිස්භටයා පිබිදෙන්නේ සුනන්ද පදවාගෙන ආ වාහනයේ නළා හඬට ය. නළා හඬ හඳුණාගත්ත ද ඔහු ගේට්ටුට විවෘත කරන්නේ මුර කුටියේ කුඩා කවුළුවෙන් බලා මන්ත්‍රීවරයා ගේ වාහනය බව තහවුරු කරගැනීමෙන් පසුව ය.

"මහත්තයා.. ගෙදර ආවා.." පෝට්කෝච් යට වාහනය නවත්වන අතර සුනන්ද කියයි. රණසිංහ තවමත් තඳ නින්දේ ය. වාහනයට ගොඩ වූ මොහොතේ සිට ටික දුරක් යන තෙක් මොන මොනවාදෝ දොඩවමින් ආ ඔහු ඉක්මනින්ම නින්දට වැටී සිටියේ ය.

වාහනයේ අතෙක් පසින් ආ සුනන්ද දොර හැර රණසීංහ නැගිටුවා ගන්නට උත්සාහ කරයි. රණසිංහ වාහනයෙන් බසින්නේ දෙතුන් වතාවක උත්සාහයකින් පසුව ය. සුනන්ද ඔහු වත්තන් කර ගනිමින් පඩි පෙළ නගියි.

ගෙතුළ විදුලි පහන් තවමත් දැල්වෙමින් ඇත. සාලය හරහා ඇවිද එන්නෙකුගේ ඡායාව ජනෙල් වීදුරුවෙන් පෙනෙයි. ඒ වින්ධ්‍යා බව සුනන්දට හඳුනා ගත හැකි ය. ඕ දොර ඇර රණසිංහ වාරු කරගත් සුනන්දට ගෙට ගොඩ වන්නට ඉඩ දෙන්නේ කතා බහකින් තොරව ය.

"මහත්තයට මගදි නින්ද ගියා.." සුනන්ද කියන්නේ යමක් කිවයුතු නිසාවෙනි.

"ඔහොමම කාමරේ ඇඳටම එක්ක යන්න.." වින්ධ්‍යා කියන්නේ සුනන්ද කී දේ නඇසුණා සේ ය. ඒ ස්වරය අසාමාන්‍ය ලෙස තැන්පත් එකක් යයි සුනන්දට සිතෙයි. ඒ අසාමාන්‍ය තැන්පත් බව හමුවේ සිතට එන වරදකාරී හැඟීම විශාල වදයක් ලෙස සුනන්දට දැනෙයි.

සුනන්ද රණසිංහ ඇඳෙහි හාන්සි කරවයි. තමා පසුපසින් කාමරයට එන වින්ධ්‍යාගේ සුවඳ ඔහුට දැනෙයි. සුනන්ද රණසිංහගේ දෙකකුල් ඔසවා ඇඳ මත සිරුවෙන් තබයි.

"මහත්තය වැඩිය බිව්වෙ නැහැ.. මහන්සියට වෙන්න ඇති නින්ද යන්න ඇත්තෙ.." සුනන්ද වින්ධ්‍යා දෙස නොබලා ම කියයි. කාමරයේ දොර උළුවස්සට වාරු වී බලා සිටින වින්ධ්‍යා සිනාසෙන්නේ උපහාසයෙනි.

"සුනන්ද.."

සුනන්ද පළමු වතාවට හැරී වින්ධ්‍යා දෙස බලයි.

".. ඕනෑවට වඩා හොඳ වෙන්න යන්න එපා සුනන්ද.. අනිත් මිනිස්සු වැරදි කළාම ඒවායේ හොඳ නරක විඳගන්න එයාලටම ඉඩ දෙන්න.. ඔයා අපරාදෙ ඒව අතේ දා ගන්න එපා.."

යමක් කිව යුතු නමුත් සුනන්ද නිහඬව ඇය දෙස බලා සිටියි.

"මන්ත්‍රී කෙනෙකුට සමාජ වගකීමක් කියලා දෙයක් තියෙනවා සුනන්ද.. තමන්ට හොඳයි කියලා හිතෙන හැම දෙයක්ම ඔහේ හිතට එන එන හැටියට කරන්න එයාලට අයිතියක් නැහැ.. සමාජය ඉදිරියේ ආදර්ශමත් පුරවැසියෙක් හැටියට ජීවත්වෙන්න එයාලා දැනගන්න ඕනෙ.. එහෙම බැරි නම් මන්ත්‍රී පදවි කියන වැදගත් තනතුරු වලින් අයින් වෙන්න ඕනෙ.."

"බයිලා.." වෙනෙකෙකුට නම් සුනන්ද දෙන්නේ ඒ පිළිතුරයි. වින්ධ්‍යා වෙනුවෙන් එවන් වදනක් යොදන්නට ඔහුට නොසිතෙයි. "ඔය කියන දේවල් තියෙන්නෙ මනස් ලෝක වල විතරයි.." ඔහු කියයි.

"මනස් ලෝක වල නෙවෙයි... හැබෑවටම එහෙම ආදර්ශමත් දේපාලකයන් හිටිය යුගයක් කිබුණා.. පාදඩයන් පාර්ලිමේන්තු යැව්ව අපේම මිනිස්සු තමයි විහින් ඒක නැති කරගත්තෙ..."

වින්ධ්‍යා සමග වාදයකට පැටලෙන්නට සුනන්දට නොසිතෙයි. මේ එයට වේලාව නොවේ.

"සුනන්ද තේ එකක් බොනවද..?" වින්ධ්‍යා අසන්නේ සාලයට එන අතරතුරදී ය.

"එපා.. මං ඉක්මනට යන්න ඕනෙ.."

"මේ රෑ යන්න එපා... මං අනෝමට කියන්නං ඉස්සරහ කාමරේ සුනන්දට ලෑස්ති කරලා දෙන්න කියලා.. උදේට යන්න.."

සුනන්ද නැවතී වින්ධ්‍යා දෙස බලන්නේ සිනාසෙමින් ය.

"අමතක වුණාද..? මං දාහතේ වත්තෙ කොල්ලෙක්.. රෑයි දවාලයි කියලා අපට වෙනසක් නෑ මැඩම්.."

වින්ධ්‍යා මොහොතක් කල්පනා කරමින් සිටියි.

"එහෙම නම් සයිකලේ යන්න එපා.. පිකප් එක අරගෙන යන්න.."

"මං බයික් එකේ යන්නම් මැඩම්.." සුනන්ද වාහනයේ යතුර වින්ධ්‍යා වෙත දික්කරන අතර කියයි. ".. ඔය වෙන්න එපා... මං මන්ත්‍රී කෙනෙක් නෙවෙයිනෙ"

"මහා හිතුවක්කාරයෙක්.." වින්ධ්‍යා ඔහු අතින් යතුර ගනියි. ඇගේ කටහඬෙහි ඇත්තේ තරහක් නොවන බව සුනන්ද දනියි. "දන්නවද... මන්ත්‍රී කෙනෙකුට කරදරයක් වුණොත් බාගයක් දුක් වෙද්දි බාගයක් සතුටු වෙනවා.. ඒත් හොඳ මිනිහෙකුට කරදරයක් වුණොත් ඒක හැමෝටම දුකක්..."

000000

නිසි පදමට තැවූ කෙසෙල් කොළයේ සුවඳ මුලුතැන් ගෙය පුරා පැතිර යයි. සමදරා ඒ මතට බතුත් ඉස්සන් බැදුමත් බෙදයි. ඉතිරි ව්‍යංජන බෙදන්නට කළින් ඕ පහත් වී චිත්ත පොටින් කඳුළු පිසදා ගනියි. අපිත් හමුදාවට ගිය දා සිට මේ කඳුළු වියැළෙන්නේ නැත. සිත තුළ නිරන්තරයෙන් දැවෙන මහ ගින්න නිවෙන්නේ ම නැත.

"අම්මා මං ලෑස්තියි..." අපිත් කියන විටත් ඈ සිටියේ හැන්ද අතේ තබාගත්වන ම කල්පනාවක ය.

බත් පාර්සලයත් සීනිසම්බෝල බෝතලයත් රෙදි මල්ලට දැමූ සමදරා එයද අතැතිව සාලයට එයි. අම්මා අතින් ගත් රෙදි මල්ල අපිත් සිය ගමන් මල්ල තුළ සුරැකිව තැන්පත් කරන්නේ මහත් භක්තියකින් ය. මේ පාර්සලයේ ඇත්තේ බත් නොව අම්මා ගේ ආදරය බව ඔහු දනියි.

අපිත් අයෝමාගේ කාමරයට නිසි පොවා බලයි. පොතට නැඹුරුකරගත් හිසින් යුතුව පාඩම් කරමින් සිටි අයෝමා හැරී බලයි. මෙයට පෙර සෑම වතාවක ම කළ සේ ම ඇය ඔහුගේ දෙපා නමදියි. ඇයට තාත්තකු නොවූ තාත්තා ඔහු ය.

"මං ගිහින් එන්නම් නංගි.." නැගනිය යමක් කියන්නට පෙර ඔහු කාමරයෙන් පිටවෙයි. ඒ ඇගේ ඇසේ නිසැකව නැගෙන කඳුළු දකින්නට අකැමැති බැවින් ය.

අම්මාගේ මුහුණ දෙස නොබලාම ඇගෙ" දෙපා නමඳින අපිත් ගමන් මල්ල කඳේ ලා ගනියි. "මයෙ පුතාට බුදුන්නෙ සරණයි..." අම්මාගෙ" කටහඬ ඔහුට ඇසෙයි. ඇය හඬන බව ඔහු දනියි. හිස ඔසවා ඇය දෙස බලන්නට ශක්තියක් ඔහුට නැත.

හිමිදිරි අන්ධකාරය මැද මිදුලට බැස ගේට්ටුව දක්වා ඇවිද යන ඔහු හැරී බලයි. දොරකඩ සිට බලා සිටින අම්මාගේත් නංගිගේත් අඳුරු රූ මෙතැනට පෙනෙයි. ඔහු ගේට්ටුව වසා මහපාරට බසින්නේ සුසුමක් හෙළමින් ය. මෙතෙක් හිතේ තද කරගෙන සිටි වේදනාව කඳුළක් ලෙසින් ඇස් තෙත් කරනු ඔහුට දැනෙයි.

හමුදා රැකියාව අතහරින්නැයි රණසිංහ පෙරදා රෑයේ කළ ඉල්ලීම ඔහුට සිහිපත් වෙයි. රණසිංහ නිසැකවම තමාට රැකියාවක් සොයා දෙනු ඇතැයි විශ්වාසයක් අපිත්ගේ සිතේ ගොඩනැගී ඇත. ඒ ගැන සිතා බැලිය යුතු යයි ඔහුට සිතෙයි.

වීදියේ විදුලි පහනේ මළානික එළියෙන් බස් නැවතුමේ අන්ධකාරය යන්තමින් මැකෙයි. කොන්ක්‍රීට් බස් නැවතුමේ ඉහළින් ඇඳ ඇති අතුරු මඳ එළියෙන් යන්තමින් පෙනෙයි.

"දැයෙන් සමුගත් කෝප්‍රල් සරත් රණතුංග රණවිරුවා සමරණු වස් ඉදිකරන ලදී"

දිනෙක තමා වෙනුවෙනුත් බස් නැවතුමක් ඉදිකරන්නට ගමේ මිනිසුන්ට සිදුවේදෝයි යන මූසල සිතුවිල්ල මොහැතින් බසයට නගින සෑම දිනෙකම මෙන් අඳත් ඔහුගේ සිතට නැගෙයි. ඔහු බස් නැවතුමේ බැම්ම මත වාඩි වෙයි. ඉක්මණින් බසයක් එනු ඇතැයි ඔහුට සිතෙයි. යුද පිටියට ගිය විට සිතත් සිතුවිලිත් වසා දැමිය හැකි බව ඔහු අත්දැකීමෙන් දනියි.

0000000

බණ්ඩාර මහත්තයා ආවාස ගෙය දෙසට එනු ජනේලය තුළින් නිසැල්ව පෙනෙයි. ඔහු එන්නේ කල්පනාවෙන් බර වූ මුහුණින් ය. ළඟ එන ඡන්දය වෙනුවෙන් ස්වාමීන් වහන්සේලාගේ සාකච්ඡාවක් සඳහා උදෑසනම ලොකු හාමුදුරුවන් වැඩිය බව නිසල් දනියි.

නිසල් පාඩම් පොතට හිත යොමන්නට උත්සාහ කරයි. වරින් වර සාලය දෙසින් බණ්ඩාර ගේ කටහඬ ඇසෙයි. සෙදෝරිස් දුම් දමන තේ කෝප්පයක්ද අතැතිව සාලය දෙසට යනු නිසල් දකියි.

"නියමිත කාලෙට කළින් ඡන්දයක් තියන්න මැඩම්ට සිද්ද වුණේ අපේ බලාපෙම නිසයි.." බණ්ඩාර කියන්නේ සෙදෝරිස් අතින් තේ කෝප්පය ගන්නා අතර විය යුතුය. පොඩි හාමුදුරුවන් බණ්ඩාර ගේ කතාවට බාදා නොකර අසා සිටින බව නිසල්ට ඇසෙයි. තමන්ගේ කතාව මැදදී කිසිවකු බාදා කරනවාට බණ්ඩාර කොහොමත් කැමති නැත. ඒ බව පොඩි හාමුදුරුවෝ ද දනිති. "තව අවුරුද්දක් ලොක්ක ආණ්ඩුව ගෙනිච්ච නම් රට කොටින්ට සින්නක්කරම ලියලා දෙනවා දෙනවාමයි.. අපි නිසයි රට බේරුණේ"

"බණ්ඩාර මහත්තයලා ජන්දෙට කළින් ගිවිසුමක් අස්සන් කරන්ඩ යනවා කියන්නෙ.."

"ජනවාරි 20 අපි ගිවිසුම අස්සන් කරනවා.. මේක හාමුදුරුවන්ගේ අපේ රටේ ඓතිහාසික අවස්ථාවක්... අන්තිමේ අපේ කොන්දේසි වලට එකඟ වෙන්න එයාලට සිද්ද වෙනවා පොඩි හාමුදුරුවනේ.. අපේ සහයෝගය නැතුව කාටවත් ආණ්ඩු පිහිටුවන්ඩ බැහැ.. ඒක තමයි යාතාර්ථය.."

"කොහොමින් කොහොමින් හරි රටට හොඳක් වෙනවා නම් අපටත් ඒක සතුටක් මහත්තයා.. ඒත් ඉතින් ඔය වගේ ගිවිසුම් කියක් නං අපේ රටේ අස්සන් කරන්ඩ අදද්ද..? වෙන එකක් තියා තමන්නෙ නායකයාගෙ මිහි පෙට්ටිය උඩ තියලා අස්සන් කළ ගිවිසුමත් කඩපු ලොක්කන් ලොක්කියන් ඉන්න රටක්නෙ මේක.."

"අපි ඒ වගේ අවස්තාවාදීන් නෙවයි අපේ හාමුදුරුවනේ.. අපි ඉස්සරහට යන්නෙ යම් ප්‍රතිපත්තියක් ඇතුව.. ඒත් මේ අවි අස්සේ අපේ හාමුදුරුවරු කරන වැඩෙන් වෙන්නෙ මේ දේශප්‍රේමී බලවේග නොමග යවලා ආණ්ඩුවට වාසියක් දෙන එකයි.. මේ වැඩෙන් වෙන්නෙ කොට තවත් ශක්තිමත් වෙන එක විතරයි.. අපේ ලොකු හාමුදුරුවන්ට ඒක තේරුම් කරලා දෙන්න ඕනෙ හාමුදුරුවනේ.. මේ ඓතිහාසික අවස්ථාවෙ නොමග යන්න එපාය කියලා තේරුම් කරලා දෙන්න ඕනෙ"

"බණ්ඩාර මහත්තයාලත් දේශප්‍රේමියි.. හාමුදුරුවරුත් දේශප්‍රේමියි.. එක එක්කෙනාගෙ දේශප්‍රේමය එකිනෙකින් වෙනස් වෙන්නෙ කොහොමද කියලා මට තේරෙන්නෙ නැහැ මහත්තයා.."

000000

විශ්ව විද්‍යාලයම කඩි ගුලකට ගලකින් ගැසුවා සේ ඇවිස්සී ඇත. කුලපතිවරයා ගේ කාමරය වටකරගත් සිසු සිසුවියන්ගේ ඝෝෂාව මහපාරටත් ඇසෙයි. මේ රැල්ලට එක් වී පෙරළි කරන්නට අයෝමාට නොසිතෙයි. මෙවන් බොහෝ උද්ඝෝෂණ තුළින් පිළිබිඹු වන ප්‍රදර්ශණාත්මක හිස් වීරත්වය ඇයට අප්‍රසන්න ය.

"අපිත් යමු ද..?" කාන්චනා අසන විටත් අයෝමා නිහඬව සිටින්නේ එනිසා ය.

"අපිත් යමු.." කාන්චනා නැවත කියයි ".. හැමෝම එකතු වුණොත් ශක්තිය වැඩියිනෙ.. තිළිණා වෙනුවෙන් වත් යමු ද..?"

තවත් සිසුවන් සිව් දෙනෙකු සමගින් තුන්වැනි වසරේ තිළිණා ගේ ශිෂ්‍යභාවය අහෝසි කර දැන් දෙමසක් ගතවී ඇත. ඔවුන් අතරින් තිළිණා

34 වන පිටුවට

විශ්ව විද්‍යාලයම කඩි ගුලකට ගලකින් ගැසුවා සේ ඇවිස්සී ඇත. කුලපතිවරයා ගේ කාමරය වටකරගත් සිසු සිසුවියන්ගේ ඝෝෂාව මහපාරටත් ඇසෙයි. මේ රැල්ලට එක් වී පෙරළි කරන්නට අයෝමාට නොසිතෙයි. මෙවන් බොහෝ උද්ඝෝෂණ තුළින් පිළිබිඹු වන ප්‍රදර්ශණාත්මක හිස් වීරත්වය ඇයට අප්‍රසන්නය.

"අපිත් යමු ද..?" කාන්චනා අසන විටත් අයෝමා නිහඬව සිටින්නේ එනිසා ය.